# තිරසර සංචාරක ප්‍රවර්ධනය සඳහා කතරගම සහ සිතුල්පව්ව කලාපයේ සංස්කෘතික උරුමය දායක කරගත හැකි ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

එම්.ඊ.ඩී.කේ. මුණසිංහ[1]

ප්‍රමුඛ පද: කතරගම, සංචාරක කර්මාන්තය, සිතුල්පව්ව, තිරසර සංචාරණය

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දිගුකාලීන ඉලක්කයක් ලෙසට තිරසර සංචාරක ව්‍යාපාරය පෙන්වා දිය හැකිය. සංචාරකයින්ට සහ ප්‍රදේශවාසීන්ට පාරිසරික, සමාජ-සංස්කෘතික, ආර්ථික හා අත්දැකීම් වල බලපෑම් ධනාත්මක සමස්ත සමතුලිතතාවයක් ඇති කිරීම තිරසාර සංචාරක ව්‍යාපාරයේ ඉලක්කයයි. (ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය) එමෙන්ම ශ්‍රී ලංකාව දේශීය දැනුම ඇතුළුව සංස්කෘතිය සහ උරුමය අතින් ඉතා පොහොසත් රටකි. ඒ අනුව සංස්කෘතික හා ස්වාභාවික උරුම දෙයාකාරයෙන්ම අප පොහොසත්ය. මෙම පර්යේෂණයේදී අධ්‍යනයට ලක්කරනු ලබන අධ්‍යයන සීමාව ලෙස කතරගම සහ සිතුල්පව්ව පෙන්වා දිය හැකි අතර එම කලාපය තුළ සංස්කෘතික උරුමයන් බොහොමයක් දැකගත හැකි අතර එම උරුමයන් මූලික කර ගනිමින් තිරසර සංචාරක ප්‍රවර්ධන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම සඳහා මෙතෙක් අවධානය යොමු වී නොමැති අතර මෙම පර්යේෂණය ඔස්සේ ඒ පිළිබඳව අවධානය යොමු කෙරෙයි. එමෙන්ම කතරගම සංචාරක කලාපය තුළ සංචාරය කරන දේශීය සංචාරකයින් මෙන්ම විදේශීය සංචාරකයින් යන දෙපිරිස පිළිබඳව අවධානය යොමු කරමින් මෙම පර්යේෂණය සිදු කිරීමට බලාපොරොත්තු වන්නේය. මෙම පර්යේෂණය අරමුණ ලෙසට කතරගම සංචාරක කලාපයෙහි තෝරාගත් ක්ෂේත්‍ර දෙක ආශ්‍රිතව තිරසර සංචාරක ප්‍රවර්ධනය සඳහා උපයෝගී කරගත හැකි සංස්කෘතික උරුම අගයන් හඳුනාගැනීමයි. මෙම අරමුණ සපුරා ගැනීමට යාමේදී හමුවන ප්‍රධානතම ගැටලුව වනුයේ, කතරගම සංචාරක කලාපය ආශ්‍රිතව පවතින විභවතාවයන් තිරසර සංචාරක කලාපයක් බවට ප්‍රවර්ධනය කිරීම සඳහා කොතෙක් දුරට ප්‍රමාණවත්වේද? යන්නයි.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය සිදු කිරීම සඳහා ප්‍රධාන වශයෙන් භාවිතා කරන ක්‍රමවේදයන් දෙකකි. එනම් ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමය සහ ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමයයි. ඒ අනුව මේ සඳහා මිශ්‍ර ක්‍රමය භාවිතා කරනු ලබයි.

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
ssh2020292@ssh.rjt.ac.lk

මෙහි දී තෝරාගන්නා ලද සංචාරක කලාපයේ අධ්‍යයනයේ පහසුව සඳහා ප්‍රධාන වශයෙන් කොටස් 03 කට බෙදා අධ්‍යයනය සිදු කිරීමට බලාපොරොත්තු වන අතර එම කොටස් 03 ලෙස,

1. සංචාරක කලාපයේ වටිනාකම් සහ ගුණාංග හඳුනා ගැනීම.
2. වත්මන් සංචාරක කර්මාන්තයෙහි ස්වභාවය හඳුනාගැනීම.
3. තිරසර සංචාරක සැලැස්මක් යෝජනා කිරීම.

මෙහි පළමු පියවර ලෙස මෙම සංචාරක කලාපයන් හි පවතින උරුම අගයන් පිළිබඳව වෙන වෙනම අවධානය යොමු කරමින් තිරසර සංචාරක ප්‍රර්ධනය සඳහා එහි පවතින්නා ප්‍රධාන ගුණාංග, වැදගත්කම පිළිබඳව ප්‍රකාශයක් සහ සම්බන්ධ වන පාර්ශවකරුවන් වෙන වෙනම අධ්‍යයනයක් සිදු කරන ලදී. ඉන් පසුව එක්රැස් කරගන්නා ප්‍රථමික, ද්වීතික දත්ත විශ්ලේෂණය තුළින් තෝරාගන්නා ලද සංචාරක කලාපයේ සංචාරක කර්මාන්තයේ ස්භාවය අධ්‍යයනය සිදුකරන අතර එමගින් වර්තමාන සංචාරක කලාපයේ සංචාරක තත්ත්වය අවබෝධ කර ගන්නා ලදී. මෙම පර්යේෂණය අවසානයේ දී ශුදුඅත විශ්ලේෂණ ක්‍රමය මගින් තිරසර සංචාරක ප්‍රවර්ධන යෝජනාවලියක් ඉදිරිපත් කිරීම සිදුකරන ලදී.

**ප්‍රතිඵල සහ සාකච්ඡා**

මෙම පර්යේෂණය සිදු කිරීම සඳහා දේශීය සංචාරකයින් මෙන්ම විදේශීය සංචාරකයන් සිය දෙනෙකුගෙන් අදහස් ලබාගත් අතර ඔවුන් විවිධ වයස් කාණ්ඩවලට අයත් පුද්ගලයන්ය. එහි දී වයස 12-25 අතර 26-40 අතර 41-68 අතර 68 වැඩි ලෙස වෙන්කර හඳුනාගන්නා ලදී. එහි දී පර්යේෂණය සඳහා තෝරගත් ලද අධ්‍යයන සීමාව තුළ එනම්, කතරගම සහ සිතුල්පව්ව යන අංශ දෙක යටතේ තිබෙන්නා වූ සංචාරක ස්ථානයන් පිළිබඳව දැනුවත්භාවය හා නොදැනුවත්භාවය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට හැකි විය. තවද මෙම සංචාරක කලාපයේ සංචාරක ස්ථානයන් නරඹා ඇති පිරිස් ප්‍රමාණය පිළිබඳව වෙන වෙනම අවබෝධයක් ගැනීමට ද හැකි විය. එහි දී මෙම සංචාරක කලාපයේ සංචාරක කර්මාන්තයක් ප්‍රවර්ධනය කිරීම හෙලා තිබෙන සංචාරක පහසුකම් ප්‍රමාණාත්මක බව පිළිබඳව වෙන වෙනම අවබෝධයක් ගැනීමට හැකි විය. මෙහිදී ස්පර්ශීය අස්පර්ශීය සංස්කෘතික උරුමයන් පිළිබඳ වෙන වෙනම අවබෝධයක් තිබෙන සංචාරකයින් පිළිබඳව මෙන්ම වත්මන් සංචාරක කර්මාන්තයේ තත්ත්වය පිළිබඳ සංචාරකයින්ගේ තෘප්තිමත් හා තෘප්තිමත් නොවීම පිළිබඳව ද අවබෝධයක් ලබා ගැනීමට හැකි විය. එමගින් එම සංචාරකයින් මෙම සංචාරක ස්ථාන ප්‍රවර්ධනය කිරීමට ඇති කැමැත්ත පිළිබඳව හා උනන්දුව පිළිබඳව ද අනාවරණය කර ගැනීමට හැකි විය.

සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලි මගින් අනාවරණය කර ගැනීමට හැකි වූ කාරණාවක් වනුයේ කතරගම සංචාරක කලාපයේ කතරගම පූජාභූමිය වන්දනාමාන කරන බහුතරයෙන් සුළුතරයක් පමණක්ම සිතුල්පව්ව වන්දනාමාන

කිරීමට පැමිණෙන බවයි. එසේ සුළුතරයක් පැමිණීමට හේතුව ලෙස ඔවුන් පෙන්වා දී ඇත්තේ සිතුල්පව්ව පූජා භූමියට ළඟා වීමට තිබෙන දුෂ්කර මාර්ගයයි. ඒ සඳහා විධිමත් පොදු ප්‍රවාහන සේවාවක් නොමැතිකම ද තිබෙන ප්‍රධාන දුර්වලතාවයක් ලෙසට පෙන්වා දිය හැකිය. එම නිසාවෙන් සිතුල්පව්ව සංචාරයට පැමිණෙන සංචාරකයින් සඳහා පොදු ප්‍රවාහන සේවාවක් ස්ථාපිත කිරීමෙන් සංචාරක ආකර්ශණය වර්ධනය කර ගත හැකි බව හඳුනා ගැනීමට හැකි විය. තවද කතරගම පූජා භූමිය සංචාරක කලාපය තුළ තිබෙන යටිතල පහසුකම් සිතුල්පව්ව පූජා භූමිය තුළ දැකගැනීමට නොහැකි වීම ද තවත් හේතුවක් ලෙස ඔවුන් පෙන්වා දී ඇත. කතරගම සංචාරක කලාපය තුළ ද සංචාරකයින්ගේ ආකර්ෂණය වැඩියෙන් යොමු වී ඇත්තේ ස්පර්ශය සංස්කෘතික උරුමයන් බවට පමණක් අනාවරණය කර ගැනීමට හැකි වූ අතර අස්පර්ශීය සංස්කෘතික උරුමයන් පිළිබඳ වැඩි අවධානයක් යොමුවී නොමැත. කතරගම කෞතුකාගාරයක් පැවති නමුත් එම කෞතුකාගාරය තුළින් සංචාරක ස්ථාන පිළිබඳව සංචාරකයින් ගේ යොමුව ප්‍රමාණාත්මක බවක් දැක ගැනීමටද නොහැකි විය. මෙම කලාපය තුළ දැකගත හැකි විශාලතම දුර්වලතාවයක් වන්නේ ක්ෂේත්‍ර මාර්ගෝපදේශකයන් ඉතා අඩුවීමයි. එම හේතුව නිසාවෙන් පැමිණෙන සංචාරකයන්ට එම උරුමයේ නිසි අගයන් පිළිබඳව හරි අවබෝධයක් ලබා ගැනීමට අපහසු වනු ඇත. තව දුරටත් මාර්ගෝපදේශනයක් නොමැතිකමෙන් සංචාරක කලාපයෙන් ලබාගත හැකි උපරිම අත්දැකීම් සංචාරකයාට ලබා ගැනීමට ද නොහැකි වනු ඇත. නිසි පලපුරුද්දක් සහ ක්ෂේත්‍ර පිළිබඳ නිසි අවබෝධයක් ඇති සංචාරක මාර්ගෝපදේශකයන් මෙම ස්ථාන සඳහා යොමු කිරීමෙන් මෙහි සංචාරය කරන සංචාරකයින් හට මෙම ක්ෂේත්‍ර පිළිබඳව නිසි අවබෝධයක් ලබාගැනීමට හැකියාව ලැබෙනු ඇත.

## සමාලෝචනය

කතරගම සහ සිතුල්පව්ව සංචාරක කලාපයන් තිරසර සංචාරක කර්මාන්තයක් ලෙසට ප්‍රවර්ධනය කර හැකි නමුත් අඩු සංචාරක ආකර්ෂණය හිමි කරගත් සිතුල්පව්ව වැනි සංචාරක කලාපයන්වල ඇති විභවතාවයන් හඳුනා ගැනීම මෙහි ප්‍රධාන වශයෙන් සිදුකළ යුතු කාරණාවක් බව පෙන්වා දිය යුතුය. කතරගම මෙන්ම සිතුල්පව්ව සංචාරක කලාපයන් තුළ සංස්කෘතික, ආර්ථික, පාරිසරිකය වටිනාකම් හඳුනාගෙන එහි අස්පර්ශයේ ස්පර්ශීය උරුමයන් වෙන වෙනම සංචාරකයින්ට අවබෝධයක් ලබා දීමෙන් සංචාරක කර්මාන්තයට සුවිශේෂී බලපෑමක් සිදුකළ හැකි සුවිශේෂී ස්ථානයක් බවට අධ්‍යයන ක්ෂේත්‍රය අධ්‍යයනය තුළින් අනාවරණය කර ගැනීමට හැකි විය.

## ආශ්‍රිත මූලාශ්‍රය

මධ්‍යම සංස්කෘතික අරමුදල. (2015). හම්බන්තොට දිස්ත්‍රික්ගේ සමාජ - සංස්කෘතික උරුමය. මධ්‍යම සංස්කෘතික අරමුදල.

Sri Lanka Tourism Development Authority. (n.d.). ***Sustainable tourism. Sri Lanka Tourism Development Authority.*** Retrieved March 9, 2025, from https://www.sltda.gov.lk/si/sustainable-tourism

Sustainable tourism worldwide - statistics & facts. (2022). ***Statista. Retrieved from Statista***: https://www.statista.com/topics/1916/green